# අර්තාපල් වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



## රූපමය කාඩ් පත්

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk

# අර්තාපල් වගාව

## රෝග හා පළිබෝධ හඳුනාගැනීම හා මර්ධනය කිරීම



### තාක්ෂණික දායකත්වය


- කේ. පුෂ්පාංජී - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- ආචාර්ය පී. එච්. රණවීර - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- ටී. කේ. ඒ. අයි. හජ්ජි - ප්‍රාදේශීය පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල
- එච්. ඒ. එස්. එන්. හෙට්ටිආරච්චි - කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය
- එම්. එස්. ඩබ්. ප්‍රනාන්දු - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව
- ආචාර්ය ජේ. පී. මාරසිංහ - පළිබෝධ නාශක රෙජිස්ටාර් කාර්යාලය, පේරාදෙණිය


### සැකසුම


- පී. එස්. පී. තෙන්නකෝන් - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව
- කේ. ඒ. යු. එන්. එන්. බණ්ඩාර - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නෝරුව





කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
2024

# අල ඉපියා



### හානි වූ පත්‍ර හා අලයක්

පත්‍ර අභ්‍යන්තර කොටස් ආහාරයට ගැනීම නිසා පත්‍ර තුළ උමං ඇති වී පත්‍ර වියළී යාම සිදුවේ. අංකුර හා කඳන් හානිවීමෙන් අංකුර මියයාම හා කඳන් කඩා වැටීමද සිදු වේ. අලයේ සිදුරු කරන ලද ස්ථානවල පිටකරන අපද්‍රව්‍ය දැකිය හැක. කපා බැලූ විට අක්‍රමවත් උමං ඇත.



### කීටයා

සුළු වශයෙන් රෝස හෝ කොළ පැහැතිය. වැඩුනු කීටයා දිග මි. මී. 15-20 දිගය. හිස තද දුඹුරු පැහැති වේ.



### පිළා කෝෂය

තැඹිලි පැහැති වේ. ක්ෂේත්‍රයේ දී පත්‍රවල හා පසෙහිද දැකිය හැක. ගබඩාවේදී, අර්තාපල් ආකන්ද මත කූඩ ,ආධාරක හෝ බිත්තියේ පැලුම් මත දැකිය හැකිය.



### සුහුඹුල් සලබයා

අළු පැහැති ය. මි. මී. 10-15 පමණ වේ. සවස් කාලයේ වඩා සක්‍රීය වේ.

# අල ඉපියා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ක්ලෝරන්ට්‍රානිලිප්‍රෝල් 20% + තයාමෙතොක්සාම් 20% WG | ග්‍රෑම් 05 |
| පිරිමිෆොස් මෙතිල් 500 g/l EC* | මි.ලී. 64 |
| ඇසිටැමිප්‍රිඩ් 20% SP* | ග්‍රෑම් 16 |
| නොවැලියුරෝන් 100 g/l EC* | මි.ලී. 16 |

* ගබඩාව පිරිසිදු කිරීමේදී යොදා ගන්න.

## ගබඩාවේ දී සිදුවන හානිය කලමණාකරණය

- ක්ෂේත්‍රයේ දී අල ඉපියාගේ හානිය රහිත, තුවාල නොවූ, පස් වලින් තොර, අර්තාපල් ආකන්ද ගබඩා කිරීම
- බීජ සඳහා අර්තාපල් ආකන්ද ගබඩා කිරීමේදී අර්තාපල් ආකන්ද කිලෝ ග්‍රෑම් 100 ක් සඳහා, තයොසයික්ලම් (හයිඩ්‍රජන් ඔක්සලේට් 50% SP ) ග්‍රෑම් 40 ක් යොදා බීජ ප්‍රතිකාර කිරීම
- අල ඉපියන් සිටින බවට තහවුරු කර ගැනීම සඳහා පෙරමෝන උගුල භාවිතා කරන්න.

## වෙනත් පාලන ක්‍රම

- හොඳින් ජල සම්පාදනය
- නියමිත කාලයේදී අස්වනු නෙලීම.

## වළක්වා ගැනීම

### ක්ෂේත්‍රයේ

- බීජ අල ගැඹුරින් සිටුවීම (සෙ. මී. 15 පමණ) හා පස් යොදා හොඳින් ආවරණය කිරීම.
- අල ඉපියා හානි නොවූ ගුණාත්මක බීජ භාවිතා කිරීම.

### ගබඩාවේ දී

- සුහුඹුල් සතුන්ට ඇතුළු වීමට නොහැකි වන සේ ගබඩා හොඳින් ආවරණය කරන්න හා කැඩී බිඳී ඇති ස්ථාන පිළිසකර කිරීම
- අර්තාපල් ගබඩා කිරීමට පෙර ගබඩාව හා ගබඩා කරන කුඩ හොඳින් පිරිසිදු කිරීම
- පිරිසිදු කරන ලද ගබඩා කෘමිනාශක වලින් ප්‍රතිකාර කිරීම

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පත්‍ර කණින්නා



**හානි වූ පත්‍රයක්**

කීටයන් පත්‍ර අභ්‍යන්තර කොටස් ආහාරයට ගැනීම නිසා සිහින් සුදු පැහැති රටාවන් ඇති වේ.



**කීටයා**

ඉදිරි පෙදෙස උල් ස්වභාවයක් හා පසුපස මොට ස්වභාවයකින් යුක්ත මි.මී. 2-3 පමණ දිග වේ.



**පිළා කෝෂය**

කීට අවධිය අවසානය පත්‍ර මතුපිට පැමිණ පසට වැටී පිලා අවධියට පත්වේ. මි.මී. 1-2 පමණ දිගය. රතු දුඹුරු පැහැතිය.



**සුහුඹුල් මැස්සා**

මි.මී. 2 ක් පමණ වේ. කළු පැහැතිය. උදරයෙහි දිලිසෙන කහ පැහැති ලප ඇත.

# පත්‍ර කණින්නා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| ඇසඩිරැක්ටින් 50 g/l EC | මි.ලී. 32 |
| ඇබමැක්ටින් 18 g/l EC | මි.ලී. 10 |

## වෙනත් පාලන ක්‍රම

- කහ පැහැති ඇලෙන උගුල් ස්ථාපනය කිරීම
- ස්වාභාවික පරපෝෂිතයන් යොදා ගැනීම
- සමනළ අතංගුව භාවිතා කිරීම

## වළක්වා ගැනීම

- ක්ෂේත්‍ර හොඳින් වල් පැලෑටි මර්ධනය කිරීම
- පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කර දැමීම
- ගැඹුරට සී සෑම



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# කීයත් පණුවා









**හානියට ලක් වූ ශාකයක් හා ආකන්ධයක්**

කීටයා ළපටි ශාක පොළව මට්ටමෙන් කපා දමයි. ගහනය අධික අවස්ථාවලදී පත්‍ර කා දමයි. ආකන්ද වර්ධනය වන අවධියේ දී ආකන්ධ වලට හානි කරයි.

**කීටයා**

සෙ.මී. 3 - 5 ක් දිග ලා අළු, අළු දුඹුරු හෝ කළු පැහැතිය. බාධාකළ විට C හැඩයට හැකිලේ. දීවා කාලයේදී පසෙහි හෝ අපද්‍රව්‍ය තුල සැඟ වී සිට රාත්‍රී කාලයේ දී සක්‍රීය වේ.

**පිළා කෝෂය**

තද තැඹිලි පැහැයට හුරු දුඹුරු පැහැයක් ගනී. සෙ.මී. 1.5 - 2 ක් පමණ දිග වේ. පහසුවෙන් පියවි ඇසට හඳුනා ගත හැකිය.

**සුහුඹුල් සලඹයා**

සෙ.මී. 3-.5 ක් පමණ දිග වේ. ඉදිරිපස පියපාත් තද දුඹුරු සිට කළු පැහැයෙන් යුක්ත වේ. පියාපත් අවසානයේ අක්‍රමවත් පටියක් හා ඉදිරියේ බෝංචි හැඩති සලකුණක් දැකිය හැක.



# කියත් පණුවා

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

- මෙම පළිබෝධකයා පාලනයට අර්තාපල් වගාව සඳහා රසායනික නිර්දේශයන් නිකුත් කර නොමැත.

## වෙනත් පාලන ක්‍රම

- කීටයන් අතින් අහුලා ඉවත් කිරීම.
- සුහුඹුලා සඳහා ආලෝක උගුල් භාවිතා කිරීම.

## වළක්වා ගැනීම

- පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කර දැමීම.
- හොඳින් ගැඹුරට සීසෑම කිරීම.
- ක්ෂේත්‍රයේ හා අවට වල් පැළෑටි මර්ධනය කිරීම.





වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# රන් වන් කෝෂ්ඨ වටපණුවා



**හානි වූ ශාකයක්**

ක්ෂේත්‍රයේ තැනින් තැන දුර්වල වර්ධනයක් පෙන්වයි. පසුව ඒවා කහ වී සහ මැලවී යයි.



**මුල් වලට සවි වී ඇති කෝෂ්ඨ**

වර්ධනය අඩුවී ඇති ශාක ගලවා බැලුවිට ඉතා කුඩා සුදු / රන්වන් පැහැති තිත් වැනි කෝෂ්ඨ දැකිය හැක.



**කෝෂ්ඨය**

රන්වන් පැහැතිය. මි.මී. 0.5 -0.9 අතර වේ. මේ තුළ බිත්තර ඇත. කෝෂ්ඨයක් පස තුළ වසර ගණනාවක් උවද විනාශ නොවී පැවතිය හැක.



**පිපිරී ගිය කෝෂ්ඨය**

පිපිරීමේදී වටපනුවන් 400 - 500 ක් පමණ පිටවේ.

# රන් වන් කෝෂ්ඨ වටපණුවා



## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

* මේ සඳහා නිර්දේශිත වටපණුනාශක නැත.

## වෙනත් පාලන ක්‍රම

- පෙර කන්නයේ හානිය තිබූ ක්ෂේත්‍රවල පස් පරීක්ෂාවක් සිදු කර වටපණු ගහනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- වගාව ඉවත් කළ විගස හෙක්ටයාරයට 70% ක්ලෝරීන් කුඩු කි.ග්‍රෑ. 35 ක් පසට යොදා හොඳින් මිශ්‍ර කර හොඳින් ජල සම්පාදනය කිරීම (ක්ලෝරීන් ප්‍රතිකාර කිරීම).
- සුළු වශයෙන් ආසාධනය වී ඇති ක්ෂේත්‍ර සඳහා වසර 2 හෝ 3 පුරන් කිරීම සහ අධිකව ආසාධනය වී ඇති ක්ෂේත්‍ර සඳහා වසර 5 හෝ 7 පුරන් කිරීම
- අර්තාපල් හෝ සොලනේසියේ කුලයට අයත් බෝග කන්න 3 ක් වත් වගා නොකිරීම.

## වළක්වා ගැනීම

- හොඳින් බිම් සැකසීම.
- සහතික කරන ලද බීජ අර්තාපල් භාවිතා කිරීම.
- ක්ෂේත්‍රය අවට ආසාධිත ක්ෂේත්‍ර ඇත්නම් එම ක්ෂේත්‍ර වලින් සතුන් ඇතුළු වීම වැළැක්වීම.
- බෝග මාරුව අනුගමනය කිරීම (සොලනේසියස් කුලයට අයත් නොවන බෝග සමඟ)
- ශ්‍රේණිගත කිරීම, සැකසීම හෝ ගබඩා කිරීම වැනි ක්‍රියාකාරකම් වලින් ඉවතලන අර්තාපල් හෝ අපද්‍රව්‍ය ක්ෂේත්‍රයට නොදැමීම.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# යුෂ උරා බොන කෘමීන්



### හානියට ලක් වු පත්‍රයක්

කෘමීන් යුෂ උරාබීම නිසා කොළ සහ කඳන් විකෘති කරයි. වර්ධනයට බාධා ඇති කරයි. පත්‍ර මත නෙක්‍රොටික ලප ඇති කරයි.



### පැළ මැක්කා

මි.මී. 1ක් පමණ දිග වේ. සිහින් දිගටි කහ සිට තද දුඹුරු දක්වා වර්ණ පරාසයක් දරයි. පත්‍ර යටි පැත්තේ දැකිය හැක.



### කුඩිත්තා

රෝස සහ කොළ කළු වැනි වර්ණ ගනී. පියාපත් සහිත හා රහිත අවස්ථා ඇත. පත්‍ර යටි පැත්තේ සහ අංකුර වල දක්නට ලැබේ.



### සුදු මැස්සා

සුදු පැහැතිය. දිග මි.මී. 1 - 2 ක් පමණ වේ. පත්‍ර වල යටි පැත්තේ දැකිය හැකිය.

# යුෂ උරා බොන කෘමීන්

## රසායනික පාලනය - නිර්දේශිත කෘමිනාශක

### පැල මැක්කා / කුඩිත්තා

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
| --- | --- |
| ඉමිඩාක්ලෝප්‍රිඩ් 200 g/l SC | මි.ලී. 08 |
| ඉමිඩාක්ලෝප්‍රිඩ් 70% WG | ග්‍රෑම් 02 |
| ක්ලෝරන්ට්‍රානිලිප්‍රෝල් 20% + තයාමෙතොක්සාම් 20% WG | ග්‍රෑම් 05 |
| තයෝසයික්ලාම් (හයිඩ්‍රජන් ඔක්සලේට්) 50% SP | ග්‍රෑම් 40 |
| පයිමෙට්‍රොසින් 50% WG | ග්‍රෑම් 08 |
| ෆිප්රොනිල් 50 g/l SC | මි.ලී. 16 |
| තියාක්ලොප්‍රිඩ් 240 g/l SC | මි.ලී. 04 |
| කාබොසල්ෆාන් 200 g/l SC | මි.ලී. 32 |
| කාබොක්සිලික් ඇසිඩ් - පොටෑසියම් සෝල්ට් 479.8 g/l EW | මි.ලී. 160 |

### සුදු මැස්සා

| කෘමිනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
| --- | --- |
| තියාක්ලොප්‍රිඩ් 240 g/l SC | මි.ලී. 04 |
| ක්ලෝරන්ට්‍රානිලිප්‍රෝල් 20% + තයාමෙතොක්සෑම් 20% WG | ග්‍රෑම් 05 |
| තයෝසයික්ලාම් (හයිඩ්‍රජන් ඔක්සලේට්) 50% SP | ග්‍රෑම් 40 |
| පයිමෙට්‍රොසින් 50% WG | ග්‍රෑම් 08 |

## වෙනත් පාලන ක්‍රම

- ඇලෙන උගුල් භාවිතා කිරීම.
- පත්‍රවල යටි පැත්ත හොඳින් සේදී යන සේ ජලය යෙදීම.
- ජෛව පාලන ක්‍රම යොදා ගැනීම.
- කොහොඹ ඇට නිස්සාරකය යෙදීම.

## වළක්වා ගැනීම

- වගාව ස්ථාපනයට පෙර, පෙර කන්නයේ බෝග අවශේෂ ඇත්නම් විනාශ කිරීම.
- ක්ෂේත්‍රය තුළ හා අවට හොඳින් වල් මර්දනය කිරීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පශ්චිම අංගමාර රෝගය



**ආසාදිත පත්‍රයක් (උඩුපැත්ත)**

තෙත සහිත දුඹුරු හෝ කළු පැහැති පැල්ලම් හටගනී.



**ආසාදිත පත්‍රයක් (යටිපැත්ත)**

පත්‍රයේ පැල්ලම් ඇති ස්ථානයේ යටි පැත්තේ සුදු පැහැති පුස් ස්වභාවයක් හටගනී.



**ආසාදිත ශාකයක්**

කදේ දුඹුරු හෝ කළු පැල්ලම් හටගනී.



**ආසාදිත අලයක්**

රෝගය දරුණු අවස්ථාවේ දී අල වලට රෝගය පැතිරී අල ඇතුලත දුඹුරු පැහැවේ.

# පශ්චිම අංගමාර රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

| දිලීරනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මැන්කොසෙබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 75% WG * | ග්‍රෑම් 32 |
| ෆ්ලුවසිනාම් 500 g/l SC * | මි.ලී. 08 |
| ක්ලෝරෝතලෝනිල් 500 g/l SC * | මි.ලී. 48 |
| ක්ලෝරෝතාලෝනිල් 75 % WP * | ග්‍රෑම් 32 |
| ප්‍රොපිනේබ් 70% WP * | ග්‍රෑම් 32 |
| මැනේබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් 8% WP ** | ග්‍රෑම් 40 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් එම් 4% WG ** | ග්‍රෑම් 40 |
| මැන්කොසෙබ් 60% + ඩයිමෙතොමෝෆ් 9% WP ** | ග්‍රෑම් 80 |

| දිලීරනාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මෙටිරාම් 55% + පයිරෝක්ලොස්ට්‍රොබින් 5% WG ** | ග්‍රෑම් 32 |
| අසොසිස්ට්‍රිබින් 250 g/l SC ** | මි.ලී. 16 |
| ප්‍රොපමොකාබ් 607 g/l SL * | මි.ලී. 64 |
| අයිසොප්‍රොතියොලෝන් 400 g/l EC * | මි.ලී. 40 |
| මැන්ඩිප්‍රොපමිඩ් 5% + මැන්කොසෙබ් 60% WG * | ග්‍රෑම් 48 |

* ස්පර්ශක දිලීර නාශක - අඩු ආසාදන තත්ව යටතේ

** සංස්ථානික දිලීර නාශක - වැඩි ආසාදන තත්ව යටතේ

## වළක්වා ගැනීම

- ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීම.
- නීරෝගි බීජ අර්තාපල් භාවිතා කිරීම.
- නියමිත කාලයේදී වගාව ස්ථාපිතය කිරීම.
- වගාව අවසන් වූ පසු බෝග අවශේෂ වගා භූමියෙන් ඉවත් කිරීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# පූර්ව අංගමාර රෝගය



**මුල් අවස්ථාවේ ආසාදිත පත්‍රයක්**

පළමුව තද කළු පැහැති කුඩා රවුම් ලප පත්‍ර මත ඇතිවේ.



**පසු අවස්ථාවේ ආසාදිත පත්‍රයක්**

පසුව ඒවා විශාලවේ. නාරටි අතර පමණක් විසිරී යයි.



**රෝග ලපයක්**

පත්‍ර මත ලප වලයාකාර රටාවක් පෙන්වයි.



**ආසාදිත ශාකයක්**

රෝගය දරුණු වු විට පත්‍ර කහ පැහැති වේ. පසුව පත්‍ර වියලී යයි.

# පූර්ව අංගමාර රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීර නාශක

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මැන්කොසෙබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 75% WG * | ග්‍රෑම් 32 |
| ෆ්ලූවසිනාම් 500 g/l SC * | මි.ලී. 08 |
| ක්ලෝරෝතලෝනිල් 500 g/l SC * | මි.ලී. 48 |
| ක්ලෝරෝතලෝනිල් 75% WP * | ග්‍රෑම් 32 |
| ප්‍රොපිනේබ් 70% WP * | ග්‍රෑම් 32 |
| මැනේබ් 80% WP * | ග්‍රෑම් 32 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් 8% WP** | ග්‍රෑම් 40 |
| මැන්කොසෙබ් 64% + මෙටලැක්සිල් එම් 4% WG** | ග්‍රෑම් 40 |
| මැන්කොසෙබ් 60% + ඩයිමෙතොමෝෆ් 9% WP** | ග්‍රෑම් 80 |

| දිලීර නාශකය | ජලය ලීටර් 16ක දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| මෙටිරාම් 55% + පයිරෝක්ලොස්ට්‍රොබින් 5% WG ** | ග්‍රෑම් 32 |
| ඩයිෆෙනකොනසෝල් 250 g/l EC ** | මි.ලී. 24 |
| අයිසොප්‍රොතියලෝන් 400 g/l EC ** | මි.ලී. 40 |
| කැප්ටාන් 50% WP ** | ග්‍රෑම් 32 |
| කැප්ටාන් 80% WG ** | ග්‍රෑම් 20 |

* ස්පර්ශක දිලීර නාශක - අඩු ආසාදන තත්ව යටතේ

** සංස්ථානික දිලීර නාශක - වැඩි ආසාදන තත්ව යටතේ

## වළක්වා ගැනීම

- සොලනේසියේ කුලයේ බෝග (බටු, මිරිස්, තක්කාලි) හැර වෙනත් බෝග සමඟින් බෝග මාරුව සිදු කිරීම
- වගාව අවසන් වූ පසු බෝග අවශේෂ වගා භූමියෙන් ඉවත් කිරීම
- වගාව අවට ධාරක වල් පැළෑටි ඉවත් කරන්න

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# වියලි කුණු වීම හා ෆියුසේරියානු මැළවීමේ රෝගය



**ආසාදිත ශාකයක්**

පත්‍ර පිලිස්සී ගිය ස්වභාවයක් පෙන්වයි.



**ආසාදිත ශාකයක්**

පත්‍ර කහ පැහැ වී රෝල් වී දුර්වල වර්ධනයක් ද පෙන්වයි.



**ආසාදිත අලයක් (බාහිර)**

පළමුව ගිලුණු වියලි පැල්ලම් ඇති වේ. පසුව වියලි කුණුවීමක් සිදුවේ. පිට පොත්ත ඇතුලට ගිලී යන අතර මතුපිට වලයාකාර රටාවකට රැලි වැටී යයි.



**ආසාදිත අලයක් ( ඇතුළත)**

අලය තුළ සුදු පැහැයට පුස් වර්ධනය වේ.

# වියළි කුණු වීම හා ෆියුසේරියානු මැළවීමේ රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

### ක්ෂේත්‍රයේ දී

| දිලීරනාශකය | දිය කළ යුතු ප්‍රමාණය |
|---|---|
| තයෝපනේට් මෙතිල් 50% + තිරාම් 30% WP | ග්‍රෑම් 50 / ජලය ලීටර 50 / වර්ග මීටර 10 කට |
| පෙන්සිකියුරෝන් 25% WP | ග්‍රෑම් 70 / ජලය ලීටර 50 / වර්ග මීටර 10 කට |
| තිරාම් 80% WP | ග්‍රෑම් 100 / ජලය ලීටර 50 / වර්ග මීටර 10 කට |
| කාබෙන්ඩසිම් 50% WP | ග්‍රෑම් 70 / ජලය ලීටර 50 / වර්ග මීටර 10 කට |

* පස තෙත්වන ලෙස යෙදීම සඳහා.

### බීජ අර්තාපල් ගබඩාවේදී

| දිලීරනාශකය | අල කිලෝ 1000 කට |
|---|---|
| තයෝපනේට් මෙතිල් 50% + තිරාම් 30% WP | කි. ග්‍රෑ. 01 |

## වළක්වා ගැනීම

- නිරෝගී බීජ අර්තාපල් වගාව සඳහා යොදා ගැනීම.
- වෙනත් බෝග (ගෝවා, නෝකෝල්, බ්‍රෝකොලි, රාබු වැනි බෝග) සමග බෝග මාරුව.
- බීජ සඳහා ගබඩා කිරීමේදී යාන්ත්‍රික හානි වූ බීජ නොගැනීම.

වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# බැක්ටීරියානු හිටු මැරීමේ රෝගය



**ආසාදිත ශාකයක්**

ආරම්භක රෝග ලක්ෂණ වන්නේ තනි අතු හෝ අතු කිහිපයක් සුළු වශයෙන් මැලවීයාමයි.




**රෝගය හඳුනා ගැනීම**

කඳ කපා ජලයට දැමූ විට සුදු පාටට බැක්ටීරියා ශ්‍රාවය පිටවේ.



**ආසාදිත අලයක්**

අලයේ ඇස් වලින් කිරි පැහැති බැක්ටීරියා ශ්‍රාවය පිටවේ.



**කැපූ ආසාදිත අලයක්**

අලයේ හරස්කඩ කිරි පැහැති ශ්‍රාවයක් පිට විම දැකිය හැක. දුඹුරු පාට වලයක් පසුව සෑදේ.

# බැක්ටීරියානු හිටු මැරීමේ රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත රසායනික

- මේ සඳහා නිර්දේශිත රසායනික නැත.

## වෙනත් පාලන ක්‍රම

- රෝගී ගස් ගලවා විනාශ කිරීම හා එම ස්ථාන වල සිට වගාවේ අනෙකුත් ස්ථාන වලට ගලා නොයන සේ ජලය යෙදීම.

## වළක්වා ගැනීම

- වගා සඳහා නීරෝගී බීජ යොදා ගැනීම.
- අවම වශයෙන් වසර 3ක් වත් පෙර කන්නයේ රෝග පැවති බිම් වගාවට යොදා නොගැනීම.
- අවම වශයෙන් වසර 3 ක් පමණ සොලනේසියේ කුලයට අයත් බෝග වගා කළ බිමක් වගාවට යොදා නොගැනීම.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

# මෘදු කුණු වීම හා කළු පාද රෝගය



**ආසාදිත අලයක්**

ගබඩාවේදී අර්තාපල් අල දුගඳක් සහිතව මෘදු ස්වභාවයකින් යුත්තව කුණුවේ.



**ආසාදිත ශාකයක්**

පත්‍ර කහ පැහැ වීම, උඩු අතට පත්‍ර රෝල් වීම, ගස් මැලවී යාම ද විය හැක.



**ආසාදිත ශාකයක්**

ගස් පාමුල කළු පැහැති වීම හා තෙත් ස්වභාවයකින් කුණුවී යයි.



**ආසාදිත ශාකයක කඳක්**

කඳ තුල කළු පැහැති කුහරයක් ලෙස කුණුවී යයි.

# මෘදු කුණු වීම හා කළු පාද රෝගය

## රසායනික පාලනය - නිර්දේශිත දිලීරනාශක

- මේ සඳහා නිර්දේශිත දිලීරනාශක නැත.

## වෙනත් පාලන ක්‍රම

- රෝගී ගස් පස් සමග ගලවා ඉවත් කිරීම
- එම ස්ථාන වල සිට වගාවේ අනෙකුත් ස්ථාන වලට ගලා නොයන සේ ජලය යෙදීම

## වළක්වා ගැනීම

- හොඳින් ජලය බැස යන ලෙස වගාවේ ජල වහනය සැකසීම.



වැඩි විස්තර සඳහා මෙම QR කේතය ස්කෑන් කරන්න

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර
ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

www.safe.doa.gov.lk